පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

විෂය - නර්තනය

තුන්වන වාරය - නොවැම්බර් - සතිය - 04

ශ්‍රේණිය - 9

සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා
ර/නිවි/රඹුක මහා විද්‍යාලය , කලවාන.

ක්‍රියාකාරකම : **<u>ගීතයන්හි සුවිශේෂී ලක්ෂණ විමසමු.</u>**

රන්වන දුන් එහි සුවිශේෂතා - කෘෂිකාර්මික ජන ජීවන රටාවක් ගත කරන ගැමි පරිසරයක ජීවත්වන ගොවියන්, ගෙවිලියන් තම කෘෂිකාර්මික ජීවිතයේ සිදු කරනු ලබන යම් යම් සංසිද්ධි කිහිපයක් ද සශ්‍රීකත්වය හා ඔවුන්ගේ ගැමි සංස්කෘතිය පිළිබඳව ද මෙම ගීතයෙන් අර්ථ ගැන්වේ. ඒ සඳහා ගීත රචකයා ගැමි ජන වහරේ එන සරල බස්වහර කාව්‍යාත්මක ව ගළපා සහෘදයන් රසජනනය කරලීමට සමත් වී ඇත. ගීතයේ එන, 'ඉඟ නළවා කපමු, නෙළමු මිටි බැඳලා, හෝයියා යන වචන බලන්න. ඉඟ නළවා යන්නේ කාන්තාවන් ය. ගැමි ලියන්ගේ සුන්දරත්වය, සුකොමළ බව, ස්ත්‍රී පුරුෂ භේදයකින් තොර ව තම කාර්යයෙහි නියැලෙන බව, සාමූහික ව ප්‍රීතිමත් ව කාර්යය කරන බව හැඟවීමට මෙම වචන යොදා ගෙන ඇති ආකාරය කොතරම් අගනේ ද? කෘෂි කර්මාන්තයේ මිටි බැඳලා යන්නෙන් අදහස් කෙරෙන්නේ ගොයම් කපා එය කොටස කොටස එකතු කර එකට සම ප්‍රමාණයෙන් ගැට ගසීමයි. 'මඳ සුළඟේ කුල්ලෙන් පොළලා හෝ....යි....යා තල වැටිලා බොල් පොතු හැරලා' මෙවැනි වචන යොදා තිබීමෙන් කාර්ය රාශියක කාර්යක්ෂම බව කියාපායි. ධාන්‍ය වර්ග නෙළා ගත් පසු කාටුව බොල් පොතු සියල්ල ඉවත් කර ගත යුතු ය. ඒ සඳහා ධාන්‍ය හොඳින් වේළා ගත යුතු ය. තෙත් සහිත නම් සුළඟේ පොළා බොල්පොතු ඉවත් කර නොහැකි ය.

ගීත රචකයා සරල වචන කිහිපයක් යොදාගෙන එම කාර්යසියල්ල හුවා දැක්වීමට සමත් ව ඇත. එසේ ම රංචුව, හාමත, කරුණා වැනි වචන යොදා ගෙන ගැමි පරිසරයක ඇති නිර්ව්‍යාජ බව පෙන්වාදීමට සමත් ව ඇත. ගීතයක අර්ථය භාෂාව මෙන් ම එහි කලාත්මක පසුබිම පිළිබඳ විචාරාත්මක විග්‍රහයක රසවිඳීම මගින් රසඥතාව වඩා වර්ධනය කරගත හැකි ය. උදෑසන ම සූර්ය කුමරුන් ලොව බලද්දී දෙවිදේවතාවුන්ගේ පිහිට ආරක්ෂාව ලබන ගොවි රජු තම ජීවිතයේ ඉහළ ම රාජකාරිය ඉටු කර ගැනීමේ අරමුණින් කුඹුරට යයි. ඒ බව ගීතය ආරම්භයේ දී, 'දිනිඳා උදය ගිර මුදුනෙන් නැඟ එනවා සුරිඳා පිහිට යැද ගොවි කුඹුරට යනවා' යන්නෙන් දැක්වේ. මෙයින් ගැමියා තුළ පවතින ආගමික භක්තිය ඇදහිලි හා විශ්වාස පැහැදිලි වේ. එසේ ම විලම්බ ලයට එය ගැයෙද්දී භක්තිමත් බව තව දුරටත් තීව්‍ර වේ. ගීත රචකයා එසේ නිමවූ පදවැල් ගීතයේ තාලය හා ලය වෙනස් කරමින් (ද්‍රැත ලයට හා මාත්‍රා 2+2 තාලයට) ගයනු ලැබේ. 'රන්වන් දුල් කරලින් පැසිලා නැමිලා බරවීලා තල වැටිලා රමණී සෝභා කෙත්වතු පිරිලා සාරා....' ලෙස මිහිරි නදින් ගීත ගායනය ඇසෙන විට එහි රසය උද්දීපනය වේ. තල කරල් රන්වන් පාටින් එකත්පසට බර වෙයි. එම ගොවිබිමෙහි තල වැටිලා ඇත. කෙත්වතු පිරී සාරවත් බවින් පරිපූර්ණ ය. මෙය රමණීය වූ දර්ශනයකි. චිත්ත රූප මැවෙන ආකාරයට ගීතයේ තාලය, ලය හා සංගීතය යොදා තිබීම ඉතා චමත්කාරජනක ය. එමෙන් ම ගීත ඛණ්ඩ නැවත නැවත ගායනා කිරීමෙන් ගීත රසය තීව්‍ර වේ. 'කෙත්වතු පිරිලා සාරා හෝ කෙත්වතු පිරිලා සාරා' 'ඉඟ නළවා කපමු නෙළමු, මිටි බැඳලා හිස මත තබලා යාමු පෙළ සැදිලා, අස්වනුනෙළන අවස්ථාවන්ට ගොපලු දරුවන් සමඟ ගවයෝ රංචු ගැසී රැළට යති. ගවයන් බට ලී මිහිරෙන් මත් වී යන බව ගීත රචකයා රසික හදවතට පවසයි.

ගොවි බිම ගොවියාට රන් බිමකි. තමා දුක් මහන්සි වී සයිලු පල ලබා ගැනමීට යන මොහොතේ ගොවි සිත සතුටින් පිනා යයි. ප්‍රීතියෙන් උද්දාමයට පත් වෙයි. ඒ අවස්ථාව වචනයෙන් කියා නිම කිරීමට නොහැකි ය. ගැමි පරිසරයේ ඇති නිර්ව්‍යාජ බව ත් ඒ හා බැඳුණු සිරිත් විරිත් ආදියට පණ පොවන ගොවි රජාගේ හාමත දුරු වන්නේ වෙහෙස මහන්සියෙන් ලබාගන්නා අස්වැන්නෙනි. බොල් පොතු හැරලා ගත් ධාන්‍යවලින් කමත පිරී ඉතිරී ගොසිනි. මේ ආකාරයට ගොවිබිම සරු අස්වැන්න ලබා ගැනීමට හිරු රජිඳාගේ හා දෙවියන්ගේ පිහිට ලැබ සාමූහික බවින් හා භක්තියෙන් යුතු ව තම ශ්‍රමයේ අග්‍රඵලය ලබාගන්නා ගොවි මහතාගේ සිත ප්‍රබෝධයට පත් ව පිරී ඉතිරී යන සතුටින් යුතු අවස්ථාව හැඟීමෙන් යුතු ව ප්‍රකාශ කරයි. අර්ථ රසයට ශබ්ද රසය ද මනා ව ගළපා ගීතය පද රචනය කර ඇති අතර, එහි සංගීතය හා මිහිරි ගායනය සුසංයෝග කර සහෘද සිත් තුළ රසජනනය වර්ධනය කළ හැකි සාර්ථක නිර්මාණයකි.

එදිනෙදා ජීවිතයේ අත්දකින අවස්ථා අතර එක් සුවිශේෂ අවස්ථාවකි වැස්ස වැහැගෙන එන මොහොත. බොහෝවිට අවට වටපිටාව චමත්කර ජනක පරිසරය අප සිත තුළ මවා පායි. සමහර විටෙක සිත ප්‍රීතියෙන් පිනායද්දී තවත් විටෙක භයංකර සිතිවිලි මැවේ. එවැනි බියකරු අවස්ථාව හුවා දක්වමින් රචනා කරන ලද භාවපූර්ණ ගීතයක් ලෙස මෙම ගීතය දැක්විය හැකි ය. මෙහි යොදාගෙන ඇති භාෂාව සරල ය. කෙටි වැකි යොදාගෙන ගීතය අර්ථගන්වා රසවත් ව ඉදිරිපත් කර ඇත. වැස්ස එන මොහොතේ ඉතා ම කලබලකාරී කාර්යබහුල බවක් දක්නට ඇත. දර ටික තෙමුණොත් උයා පිහා ගැනීමට හැකියාවක් නැත. ඒ නිසා දර ටික ඉක්මනින් ගෙට ගැනීම ට වතුර ඉවර වී ඇති බැවින් කළගෙඩියට වතුර ගෙන ඒමට දෙදෙනා ම යමු යැයි පවසන්නේ ඉහත සඳහන් කළ දෑ අර්ථ ගන්වමිනි. හෝ හෝ හෝ ගාගෙන එන්නේ වැනි අනුප්‍රාසය දක්වෙන බස් වහරක් යොදාගෙන ඇත්තේ ශබ්ද රසය මඟින් අර්ථ රසය ඉස්මතු කරලීමට ය. එමෙන් ම අවස්ථානුකූල ව භාවාත්මක සිතුවිලි ඉස්මතු කරමින් සංයමයෙන් යුතු ව බස හසුරුවා ඇති බව පෙනෙනන් ට තිබෙන කාරණයකි.

'අක්කෙ අක්කෙ අර බලන්නකෝ වැස්සක් නොවැ එන්නේ හෝ..හෝ..හෝ..ගා ගෙන එන්නේ ගස්වැල් පෙරළෙන්නේ...' මේ අවස්ථාවේ නිවසේ ඇතිවන සංවාදය පාදක වන්නේ වැස්ස එන්නට සැරසෙන ආසන්න පරිසරයේ සිදුවන සිදුවීම් ය. 'සුළං තද යි - විදුලිය ද කොටයි හෙණ හඬ පැතිරෙයි - මහ වලාකුළක් මේ එන්නේ' සුළං හැමීමත් සමඟ ම විදුලි කොටා හෙණ හඬ මුළු පරිසරය පුරාවට ම පැතිරීමේ භයංකාර බව තව දුරටත් සිත තුළ ජනිත කරවීමට සමත් වේ. එසේ ම වැස්සට පෙර සූදානම මෙම ගීතයේ කැපී පෙනේ. මවත් පියාත් නොමැති අවස්ථාවේ ගෙදර වගකීම් දරන වැඩිමහල් දුවට බාල සහොද්‍රයා ආමන්ත්‍රණය කරන ආකාරය ඉතාමත් අගය කළ යුතු ය. එය ගීතය පුරාවට විහිදී යයි. පවුලේ සමගිය, සාමූහික බව, ආදරය පිළිබිඹු වන ආකාරයට ගී පදවැල් අමුණා ඇත. 'අක්කේ වී පැදුරත් මිදුලේ හකුළා ගෙට ගනිමු' 'අක්කේ දර ටික ගෙට ගනිමු' යනුවෙන් අක්කාට ආමන්ත්‍රණය කරන්නේ බොහෝ ළෙන්ගතුකමිනි. එසේ ම වතුර ගෙන එන්නට අක්කා සමඟ ළිඳට යමු යැයි පවසන්නේ කියාපාමිනි. වැස්ස එන වේලාවේ මල්ලි තාම කුඹුරේය.

යනුවෙන් අක්කාට ආමන්ත්‍රණය කරන්නේ බොහෝ ළෙන්ගතුකමිනි. එසේ ම වතුර ගෙන එන්නට අක්කා සමඟ ළිඳට යමු යැයි පවසන්නේ සාමූහික බව කියාපාමිනි. වැසස් එන වේලාවේ මල්ලි තාම කුඹුරේය ඔහු නොඑන නිසා එයද හිතට බිය ගෙනදෙන කරුණකි.

නංගී බියෙන් හඬන්නේ ගෙරවිලි හඬ බිල්ලන් යයි සිතාගෙන සහ මව නැති ශෝකයෙනි. නංගි සුදෝ මගෙ අඬන්නෙපා අම්ම හණික දූන් එයි බිල්ලො නොවෙයි ඔය ගොරවන්නේ අහසේ හෙන නාදේ. ලෙස පවසමින් ඇය නළවා ගන්නට දරණ උත්සාහය,ආදරය, සෙනෙහස මතුකොට දක්වයි . මෙම ගීතය මාත්‍රා 4 තාලය අනුව මධ්‍ය ලයට ගායනා කරන අතර අවස්ථාවට උචිත පරිදි රසික සිත් තුළට බිය මුසු බව,කඩිසර ගතිය,ලෙන්ගතු බව ගැඹුරින් දැනෙන පරිදි හා චිත්ත රූප මැවෙන පරිදි රචනා කරන ලද ගීතයකි.

සහායක ඉගෙනුම් ආධාරක

- e නැණ පියස - Course: 9 ශ්‍රේණිය නර්තනය
- වෙනත් youtube නාලිකා
    - තාල රංග you tube නාලිකාව - නිවිතිගල කලාප අධ්‍යාපන කාර්යාලය නර්තන අංශය
    -
- අතිරේක පොත්/ සඟරා - අත්රේක කියවීම් පොත 9 ශ්‍රේණිය නර්තනය